**09-06-2022 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, බ්‍රහ්මීණ් වංශයට අයත් වන්නා වූ ඔබ, දැන් උසස් වූ විෂ්ණු වංශයට අයත් වීමටයි සිටින්නේ. එමනිසා, ඔබ ස්ථිර වෛශ්නවයන් බවට පත් විය යුතුමයි. ඔබ ළූණු ආදී ආහාර කිසිවක් නොගත යුතුයි.

**ප්‍රශ්නය:** දරුවන් බිය නොවිය යුත්තේත්, පටලැවිල්ලට පත් නොවිය යුතු වන්නාවූත් විභාගය කුමක්ද?

**පිළිතුර:** මෙසේ, ඉදිරියට යන අතර ඔබගේ පරණ සපත්තුවට (ශරීරය) යම් අපහසුතාවයක් ඇති වුවත්, නැත්නම්, යම් අසනීපයක් හැදුනා වුවත්, ඒ ගැන බිය වීමට හෝ පටලැවිල්ලට පත් නොවිය යුතුයි. ඒ වෙනුවට ඔබ සතුටට පත් විය යුතුයි. මන්ද, ඔබ දන්නවා එය කර්ම ගෙවීමක් බව. ඔබගේ සියලු අතීත කර්ම දැන් ගෙවී යනවා. යෝගා බලයෙන් අපට කර්ම ගෙවා දැමීමට නොහැකි නම්, මෙසේ කර්ම විඳවීමෙන් අප එය ගෙවා දැමිය යුතු වනවා. ඒවා ඉක්මණින් අවසන් වනවා නම්, එය හොඳයි.

**ගීතය:** අපගේ වන්දනා ගමන අසහායයි...

ඕම් ශාන්ති. අශාරීරික වූ පරමාත්ම දෙවියන් කතා කරයි. ඔහුට තිබෙන්නේ එකම එක නමකි. මිනිසුන්ට විස්තර කරදී ඔවුන් තුළ ස්ථිර විශ්වාසය ඇති කිරීම උදෙසා ඔබ ‘ශිව දෙවියන් කතා කරයි‘ යන්න ගැන පැවසිය යුතුමයි. පියා කියනවා: මා කුමක්ද, ඒ මමයි. මගේ නම කිසිම විටෙක වෙනස් නොවේ. සත් යුගයේ දේවතාවන් අනිවාර්යෙන්ම නැවත නැවතත් උපත් ගන්නවා. පියා මෙම ශරීරය මාර්ගයෙන් දරුවන් වන ඔබට විස්තර කර දෙනවා. අප ඉන්නේ අධ්‍යාත්මික වන්දනා ගමනකයි. පියා සූක්‍ෂම වන අතර දාදාත් සූක්‍ෂමයි. ඒ උත්තරීතර පියා මේ බ්‍රහ්මාගේ ශරීරයට ඇතුළු වන බව කිසිම කෙනෙක් දන්නේ නැහැ. දරුවනුත් සූක්‍ෂමයි. ඔබ කියනවා: අප ශිව බාබාගේ දරුවන්, එමනිසා, ඔබ අනිවාර්යෙන්ම ඔහුගෙන් ඔබගේ උරුමය හිමිකර ගත යුතුයි. ඔහුගේ ශ්‍රීමත් අනුගමනය කරන්න. ඔහු ඔබගේ උත්තරීතර පියා, ගුරුවරයා හා සත්ගුරු යන විශ්වාසය ඔබ තුළ තිබෙනවා. මේවා ඉතා මිහිරි වූ කරුණු. අප ඒ අශාරීරික ශිව බාබාගේ ශිෂ්‍යයින් වන අතර ඔහු අපට රාජයෝගා උගන්වනවා. පරමාත්ම දෙවියන් කතා කරයි: දරුවනි, මා දැන් ඔබට රාජයෝගා උගන්වනවා. නගරාධිපති කෙනෙක් මෙසේ කියන්නේ නැහැ: දරුවනි. සන්‍යාසීන් පවා මෙසේ කියන්නේ නැහැ. පියාට පමණයි දරුවනි, යැයි ඇමතීමට උරුමය තිබෙන්නේ. තමා ඒ අශරීරික පියාගේ දරුවන් බවත් දැන් අප ඔහු ඉදිරියේ අසුන්ගෙන සිටිනා බවත් දරුවන් දන්නවා. ඔබ ප්‍රජාපිතා බ්‍රහ්ම කුමරුන් හා කුමරියන්. ඔබ ‘ප්‍රජාපිතා‘ යන නම නොලිවහොත් මිනිස්සු පටලැවිල්ලට පත් වෙනවා. ඔවුන් සිතනවා බ්‍රහ්මා යනු සූක්‍ෂම ලෝකයේ සිටිනා දේවතාවෙක්, ඔහු මෙහි ඉන්නේ කෙසේද කියා ඔවුන් පුදුමයට පත්වනවා. ඔවුන් කියනවා: දේව බ්‍රහ්මාට ආචාර. දේව ශංකර්ට ආචාර. ඒ වගේම ඔවුන් ගුරු බ්‍රහ්මාට හා ගුරු විෂ්ණු ගැනත් කතා කරනවා. කොහොමනමුත්, විෂ්ණු හෝ ශංකර් හෝ කිසිවෙක් ගුරුන් නොවේ. ශංකර් පාර්වතීට කතන්දරයක් කියනා නිසා, ඔහු ගුරු කෙනෙක් කියා ඔවුන් සිතනවා. විෂ්ණු පවා ගුරු කෙනෙක් නොවේ. සත් යුගයේ ලක්ෂ්මි හා නාරායන ද ගුරුන් වන්නේ නැහැ. ඒ වගේම ඔවුන් ක්‍රිෂ්ණා පවා ගීතාවේ දෙවියන් කියා ඔහුටත් උසස් ගුරු කෙනෙකු බවට පත් කර තිබෙනවා. කොහොමනමුත්, දෙවියන් යනු එකම එක කෙනා පමණයි. දරුවන් මේ කරුණ ඔප්පු කළ යුතු වෙනවා. ඔබ සූක්‍ෂම වූ හමුදාවක්. ඔබ රාවණ් පරාජය කරනවා. ඒ කියන්නේ, ඔබ මායාව පරාජයකොට ලෝකයම ජයගත්තෝ බවට පත් වෙනවා. මායා ලෙස හඳුන්වන්නේ ධනය නොවේ. ධනය ලෙස හඳුන්වන්නේ, සමෘද්ධියයි. පියා ඔබට විස්තර කරනවා: දරුවනි, මරණය දැන් ඔබ ඉදිරියේමයි. මේ අවුරුදු 5000කට පෙර කියැවුණු වචනමයි. ‘අශරීරික වූ දෙවියන් කතා කරයි.‘ යන්න වෙනුවට ඔවුන් අශරීරික වූ ක්‍රිෂ්ණා කතා කරයි කියා ඊට ඇතුළු කොට තිබෙනවා. පියා කියනවා: ඔබ දැන් ලබන්නා වූ මෙම දැනුම, ඔබගේ අනාගත තිළිණය උදෙසා වූවකි. ඔබට තිළිණය ලැබුණු පසු, දැනුමෙන් ඇති අවශ්‍යතාවයක් නැහැ. මෙම දැනුම තිබෙන්නේ අපිරිසිඳුභාවයෙන් ඉවත්ව පාරිශුද්ධත්වයට පත් වීම උදෙසාය. ඒ පිරිසිඳු ලෝකයේ කිසිම කෙනෙක්ට ගුරු කෙනෙක් යොදා ගැනීම අවශ්‍ය වන්නේ නැහැ. ඇත්තෙන්ම, මෙහි ඉන්නේ එකම එක ගුරු කෙනයි. ඒ තමයි, උත්තරීතර පියා, උත්තරීතර ජීවය. මිනිස්සු මෙසේ කන්නලව් කරනවා: අහෝ පාරිශුද්ධකරුවාණනි, එන්න. ඉතින් ඔහුම පමණක් ඒ උත්තරීතර වූ ගුරු වන බව ඔබ විස්තර කළ යුතුයි. රාමා සැමටම විමුක්තිය ලබා දෙන්නා ලෙස සිහිපත් කරනවා. එමනිසා, සෑම කෙනෙක්ම පාරිභාෂික

තත්ත්වයක සිටිනා විට ඔහු අනිවාර්යයෙන්ම පැමිණිය යුතු වෙනවා. එහි තිබෙන්නේ කිරි සයුරක් හා සතුට පිරි සයුරකි. විෂෙන් පිරි සාගරයක් එහි නැහැ. විෂ්ණු කිරි සයුරේ වාසය කරනවා නම්,අනිවාර්යයෙන්ම ඔහුගේ දරුවන් ඉන්නේත් ඔහුත් සමඟයි. ඔබ දැන් බ්‍රහ්මීණ් වංශයට අයත් වන අතර පසුව විෂ්ණුගේ වංශයෙහි කොටස් කරුවන් බවට පත් වෙනවා. ඔවුන් සම්පූර්ණ වෛශ්නවයින්. මිනිස්සු දේවතාවන්ට කිසිම විටෙක ඇණු වැනි වූ අපත්ති ආහාර පූජා කරන්නේ නැහැ. ඔබට නැවතත් එවන් වූ දේවතාවන් බවට පත් වීමට අවශ්‍ය නම්, ඒ සියල්ල දැන් අත්හළ යුතුමයි. මේ සංගම් යුගයයි. සංගම් යුගයේ ඉන්නේ බ්‍රහ්මීණ් දරුවන් වන ඔබ පමණක් බව ඔබට විස්තර කර තිබෙනවා. අනෙක් සෑම කෙනෙක්ම ඉන්නේ කලි යුගයේ. ඔබ බ්‍රහ්මීණ් කෙනෙක් බවට පත් වන තුරු ඔබට කිසිම දෙයක් වටහා ගත නොහැකියි. පියා කියනවා: මා එන්නේ චක්‍රයේ සංගම් යුගයේදීයි. මෙය සංගමයක් බවවත් ඔවුන්ට වැටහෙන්නේ නැහැ. ලෝකය වෙනස් වෙනවා. එහෙම නේද? ඔවුන් මේ ගැන කතා කරනවා. නමුත්, එය වෙනස් වන්නේ කෙසේද යන්න ගැන ඔවුන් දන්නේ නැහැ. ඔවුන් නිකම්ම ඒ ගැන දොඩවමින් ඉන්නවා. ඔබට උසස් බවට පත් විය හැක්කේ ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් පමණක් බව ඔබට ඉතා පැහැදිලි ලෙස දැන් වැටහෙනවා. ඔබ පියාව සිහිපත් කළ යුතුමයි. ඔබගේ ශරීරයත් ඒ හා සබැඳි සියලු සබඳතාත් අමතක කර දමන්න. බාබා ශරීරයකින් තොරව තමයි ඔබව එව්වේ. ඉතින් ඔබ නැවත එහි යා යුත්තේත් එලෙසයි. ඔබ තම චරිත කොටස රඟදැක්වීම උදෙසා මෙහි පැමිණ සිටිනවා. මේ සඳහා සූක්ෂම වූ උත්සාහය අවශ්‍යයි. පියාවත් ඔහු ඔබට දෙන උරුමයත් සිහිපත් කරන්න. ඔබ නැවත නැවතත් මෙය අමතක කර දමනවා. බාබාව අමතක කළ හොත් ඔබ මායාගෙන් ගුටි කනවා. මෙයත් නාට්‍යයක්. ඇලඩින්ගේ පුදුම පහන කියා කතන්දරයක් තිබෙනවා. පළමු ධර්මය ස්ථාපණය කළේ අල්ලායි. ඔහු අත්පුඩියක් ගසා දිව්‍ය ලෝකය හිමිකර ගත්තා. මෙම ධර්මය ස්ථාපනය කරන්නේ කවුද? පළමු නොම්බරයේ ධර්මය ස්ථාපිත කළේ අල්ලායි. ඔවුන් හතම්තායි (කටේ ගෙඩියක් දමාගෙන කරනා ක්‍රීඩාවක්) ක්‍රීඩාව ද පෙන්නුම් කරනවා. කටේ ගෙඩියක් දමාගෙන නොසිටිනා විට මායා එනවා. ඔබටත් මෙසේ සිදුවෙනවා. ඔබ පියාව අමතක කර දමා අනෙක් අය හැමෝම සිහි කරනවා. තමා දැන් ප්‍රථමයෙන්ම සාමයේ දේශය වෙතත්, පසුව සතුටේ දේශය වෙතත් යාමට සිටිනා බව දරුවන් දන්නවා. දුක් දේශය අමතක කර දැමීමට උත්සාහ දරන්න. මේ සෑම දෙයක්ම දැන් අවසන් වීමටයි යන්නේ. තමා ලක්ෂපතියෙක් හෝ අහවල් අහවල් කෙනෙක් කියා ඔළුවට ගන්න එපා. අප අශරීරික ලෙස පැමිණියා. මේ ශරීරය පැරණි වූවකි. මේ පරණ සපත්තුව ඔබට බොහෝ දුක් දී තිබෙනවා. ඔබට කොපමණ අසනීප වැළඳෙනවාද, ඒ තරමටම ඔබගේ සතුට වැඩි විය යුතුයි. ඔබ සතුටින් නැටිය යුතුයි. කර්ම විඳවීම තිබෙනා නිසා, ඒ කර්ම අනිවාර්යයෙන්ම ගෙවා දැමිය යුතු වෙනවා. ඒවාට බිය වන්න එපා. යෝගා බලයෙන් ඔබට ඒ පව් ගෙවා දැමීමට නොහැකි වූ නිසා, කර්ම විඳවීමෙන් මෙසේ එය ගෙවා දැමිය යුතු වන බව ඔබ වටහා ගත යුතුයි. මේ ගැන කිසි ලෙසකින් පටලැවිල්ලට පත් විය යුතු නැහැ. මෙය පරණ ශරීරයක්. එය ඉක්මණින් විනාශ වී යනවා නම් හොඳයි. ඔබගේ දින හතේ බතියත් ඉතා ප්‍රසිද්ධ වූවක්. දින හතක් පුරා මෙම දැනුම ඉතා හොඳින් වටහාගෙන එය බුද්ධිය තුළ හොඳින් ධාරණය කර ගන්න. පසුව ඔබට ඕනෑම තැනක යන්න පුළුවන්. ඔබට දිගින් දිගටම මුරලි ලැබෙයි. ඒ ඇති. නොකඩවාම පියා සිහිපත් කරමින් චක්‍රය කරකවන්න. දින හතෙන් ස්වදර්ශන චක්‍රය කරකවන්න. මිනිස්සු දින හතක් පුරා ආගමික ග්‍රන්ථ කියැවීමේ විශේෂ උත්සවයක් පවත්වනවා. දින හත ඉතාමත් ජනප්‍රිය වූවක්. ඔවුන් දින හතක් පුරා ග්‍රන්ත් යන ආගමික ග්‍රන්ථයත් කියවනවා. මෙම බතිය තිබෙන්නේත් දින හතක් පුරායි. කොහොමනමුත්, මෙහි එන සෑම කෙනෙක්ටම ඔබ දින හතක් ඒමට නොපැවසිය යුතුයි. පළමුවෙන්ම ඔබ පුද්ගලයාගේ නාඩි අල්ලා බැලිය යුතුයි. ඔවුන් පැමිණි විගස ඔබ දින හතේ පාඨමාලාව ගැන පැවසුවහොත් ඔවුන් බය වෙයි. ඔවුන්ට දැනෙනවා: අපට මෙහි ඉන්න බැරි වුවහොත් කියා ඔවුන් සිතන්නට පටන් අරගෙන යන්න යනවා. මේ නිසා තමයි පළමුවෙන්ම ඔබ පුද්ගලයා මොනවගේ කෙනෙක් ද කියා බැලිය යුත්තේ. ඔබ සෑම කෙනෙකුගේම නාඩි අල්ලා බැලිය යුතුයි. පළමුවෙන්ම ඔබ ඔවුන්ව පරීක්ෂා කර බැලිය යුතු අතර දින කීයක් පැමිණ තිබෙනවා ද කියා බැලිය යුතුයි. ඔවුන් පැමිණි විගස දින හත ගැන පැවසුවහොත් ඔවුන් බය වෙනවා. සමහරුන්ට දින හතක් ඉන්න බැහැ. සමහර වෛද්‍යවරු ඔබගේ නාඩි අල්ලා බැලූ සැටියෙන් ඔබට ඇති ලෙඩක් නැහැයි කියා කියනවා. මොහුද මේ අවිනාශී වූ දැනුමේ වෛද්‍යවරයායි. දරුවන් වන ඔබත් දෙවන වෛද්‍යවරුන්. මෙය තමයි රුද්‍රාගේ දැනුමේ යාගය. මිනිසුන්ට එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලැබිය හැකි යැයි කියා ඔබ කියනවා. ඉතින් එවිට සමහරු කියනවා: එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලැබීමට පුළුවන් කියා කියනවා නම්, අපට දින හතක් තිස්සේ එන්නැයි කියන්නේ කුමකටද? අපට එක් ක්ෂණයකින් කළ හැකි දෙයක් ගැන කියන්න. ඔවුන් තමාට මෙහි සිටීමට නොහැකි වේ යැයි කියා බිය වනවා. මේ නිසා තමයි ප්‍රථමයෙන්ම ඔබ ඔවුන්ගේ නාඩි අල්ලා බැලිය යුත්තේ. සෑම කෙනෙක්ම එකම නැහැ. බොහෝ දරුවන්

මෙහිදී අවැඩකම් කරනවා. විස්තර පත්‍රිකාව පුරවන අවස්ථාවේදී ඔබ ඔවුන්ගේ නාඩි බැලිය යුතු වන අතර ඔවුන්ගෙන් මෙසේ විමසිය යුතුයි: ඔබට දින කීයක් හි සිටීමට හැකිද? ඔබ මේ ප්‍රශ්නයත් විමසිය යුතුයි. හොඳයි, මට කියන්න, සැම කෙනෙකුගේම දෙවියන් එකම කෙනෙක්ද? උත්තරීතර පියා, උත්තරීතර ජීවයත් සමඟ ඔබට තිබෙනා සබඳතාවය කුමක්ද? පළමුවෙන්ම ඔහු පියා බවත් අප ඔහුගේ දරුවන් වන බවත් ඔවුන්ට විස්තර කළ යුතුයි. පියා උරුමයක් ලබා දෙනවා. ඔබ දිව්‍ය ලෝක උරුමය ලබාගත යුතුමයි. දිව්‍ය ලෝක නිර්මාණකරුවා ඔහුයි. දැන් තිබෙන්නේ අපායක්. භාරතය දිව්‍ය ලෝකයක් වූ කළ ලෝක පාලකයන් වූයේ ඔබයි. එය දේවතාවන්ගේ රාජ්‍යයක් වූවා. පසුව මායා ඔබගේ රාජ්‍යය උදුරා ගත්තා. ඔබ දැන් මායා පරාජය කර නැවතත් ඔබගේ රාජ්‍යය හිමිකර ගත යුතුයි. පරණ අපිරිසිදු වූ කලි යුගී ලෝකයේ විනාශය දැන් ඔබ ඉදිරියේමයි. එමනිසා, ඔබ අනිවාර්යෙන්ම ඒ පිරිසිදු ලෝකය ස්ථාපණය කළ යුතුයි. ඔබ පුංචි ඇඟවීමක් කළ යුතුයි. පසුව, ඔවුන් මේ කරුණු තේරුම් ගැනීමට පටන් ගන්නවා. අද නැත්නම්, හෙට හරි ඔවුන් එනවා. ඔවුන් වෙන කොහේ යන්නද? ඔවුන්ට ගැලවීම ලබාගත හැකි සාප්පු තිබෙන්නේ එකම එකයි. උත්තරීතර පියා, උත්තරීතර ජීවය, ශිව බාබාගේ සාප්පුව පමණයි ඒ සඳහා තිබෙන්නේ. ඔබ දැන් එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලැබීමටයි ඉන්නේ. මේ සාප්පුව කොතරම් අගනේද බලන්න. මෙම සාප්පුවේ වෙළෙන්දා ඔබයි. හොඳ වෙළෙන්දන්ට හොඳ තත්ත්තවයක් ලැබෙනවා. විකිණීම සඳහා හොඳ ගුණාංගයක් තිබිය යුතුයි. ඔවුන්ට සිහිය නැතිනම්, ඔවුන් කරනා සේවය කුමක්ද? පළමුවෙන්ම ඔවුන් තුළ විශ්වාසය ඇති කරවන්න. පසුව ඔවුන්ට දින හත ගැනත් කියන්න. ඔහෝ, නමුත් පියා පැමිණ සිටින්නේ ඔබට උරුමය ලබා දීම සඳහාය. භාරතය සතුටේ දේශය වූ නමුත්, දැන් එය දුකින් පිරි දේශයක් බවට පත් ව තිබෙනවා. පසුව එය සතුටේ දේශය බවට පත් වන්නේ කෙසේද? එය නිර්මාණය කරන්නේ කවුද? සියල්ලටම ප්‍රථම ජීව වන අප සාමයේ දේශයේ වැසියන් වන්නේත්, මෙහි පැමිණඅපගේ චරිත කොටස රඟදක්වන්නේත් කෙසේද යන මාර්ගය ඔවුන්ට පෙන්වා දෙන්න. පියා කියනවා: දරුවනි, ඔබ දැන් ඔබගේ නිවහන වෙත යා යුතුයි. පියා සිහිපත් කිරීමෙන් ඔබගේ පාප සියල්ල නැති වී යනවා. ඔබ පියාසර කර යෑමට අවශ්‍ය පියාපත් ලබා මා වෙත පැමිණෙනු ඇත. පියා පමණයි මෙහි පැමිණ ඔබව දියමන්තියක් වැනි තත්ත්වයට පත් කරවන්නේ. මෙම ආදායම ඉතා බලවත් වූවකි. පියා සිහි කිරීමෙන් ඔබ උපත් 21ක් පුරා සියලු අසනීප වලින් මිදෙනු ඇත. චක්‍රය ගැන සිහි කිරීමෙන් ඔබ සදා සෞඛ්‍යමත් හා ධනවත් වනු ඇත. දැන් ඔබට ඒ දෙකම නැහැ. ඔබ අතරිනුත් මෙය ලැබෙන්නේ අනුපිළිවෙලක් ඇතිවයි. මායා දුර්වල දරුවන්ව ඉතා ඉක්මණින් කා දමනවා. පසුව ඔබ දිගින් දිගටම දියුණුවට යන විට ඔබට මතක් වෙයි. අවසානයේදී රජවරුන් හා සන්‍යාසීන් පවා එනවා. හී තල විදුණේ කුමාරීන් හා මව්වරුන් වන ඔබ මහිනි. මෙහි තනා තිබෙනා කෝවිල් නිවැරදියි. කුමාරි කෝවිල කියාත් එකක් තිබෙනවා. මිනිසුන්ට අධර් කුමාරි (අර්ධ කුමාරි) යන්නෙහි අර්ථය වැටහෙන්නේ නැහැ. තම පවුලේ අයත් සමඟ නිවෙස් වල වාසය කරනා අතරම බී.කේ. බවට පත් වන අය තමයි අධර් කුමාරි ලෙස හැඳින්වෙන්නේ. කුමාරි කියන්නේ කුමාරි මයි. මුළු කෝවිලම නිර්මාණය වී තිබෙන්නේ ඔබගේ සිහිවටනයක් ලෙසයි. මීට ඉහත කල්පයේදීත් ඔබ සේවය කළා. ඔබ තුළ සැහෙන සතුටක් ඇති විය යුතුයි. ඔබගේ විභාගය ඉතා වැදගත් වූවකි. ඔබට උගන්වන්නේ පරමාත්ම දෙවියන්. (දිල්ලි නුවරින් පැමිණි කණ්ඩායමක් බාබාගෙන් සමුගෙන නිවෙස් බලා යනවා.) දරුවනි, ඔබ ඉතාමත් නැවුම් බවක් ලබා නැවතත් නිවෙස් බලා යනවා. එය අනුපිළිවෙලක් ඇති ව තිබෙන්නක්. හොඳින් තේරුම් ගන්නා අය අන් අයටත් ඉතාමත් හොඳින් විස්තර කරනවා. බාබා සූක්ෂම බවත් දාදාත් සූක්ෂම බවත් දරුවන්ට වැටහෙනවා. අපිත් සූක්ෂමයි. කිසිම කෙනෙක් අප ගැන දන්නේ නැහැ. බ්‍රහ්මීණ් පූජකවරුන් පවා අපව විශ්වාස කරන්නේ නැහැ. ඔවුන්ට විස්තර කර දෙන්න ඔබට පුළුවන්: ඔබ පාපයෙන් ඉපදුණු නිර්මාණයක් වන නමුත් අප බ්‍රහ්මාගේ මුඛයෙන් ඉපදුණු නිර්මාණයක්. ඔබ අපිරිසිදු නමුත් අපි පාරිශුද්ධත්වයට පත් වෙනවා. ඔබ ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන්. ඒ නිසා අනිවාර්යෙන්ම ඔබ ඉන්නේ නව ලෝකය උදෙසාය. සත් යුගයේ දේවතාවන්ද නව ලෝකයට අයත් වන්නේ? බ්‍රහ්මීණ්වරුන්ද නව ලෝකයට අයත් වන්නේ? බ්‍රහ්මීණ්වරුන්ගේ මුදුනටකර බඳිනා කොණ්ඩයක් තිබෙනවා. ඒ මුදුන් කොණ්ඩයද (බ්‍රහ්මීණ් වංශය) උසස්, නැත්නම් හිස (දේව වංශය) ද උසස්? මුදුණ්කඩ වන්නේ ශිව බාබා වන නමුත්, ඔවුන් ඔහුව නැති කර තිබෙනවා. මේ මල් වත්තෙහි උයන්පල්ලා පියා බව දරුවන් දන්නවා. රාවණ් මෙම උයන්පල්ලාගේ පාලකයා කියා කියන්න බැහැ. රාවණ් ඔබව කටු බවට පත් කරවනා අතර බාබා ඔබව මල් බවට පත් කරවනවා. මේ සම්පූර්ණ ලෝකයම කටු වලින් පිරි කැළයක්. ඔවුන් එකිනෙකාට දෙන්නේ දුකම පමණයි. පියා විස්තර කරනවා: කිසිම කෙනෙක්ට දුක් දෙන්න එපා. කෝපයෙන් කතා කරනා විට, සිය දහස් ගණනක් පාපය එකතු වන අතර ඔබ පාපකාරී ජීව බවට පත් වෙනවා. එවන් වූ ජීව වලට ලැබෙන්නා වූදඬුවම අති භයානකයි. ඔබ පියාගේ සහකරුවෙක් බවට පත් වීමට පොරොන්දු වී පසුව ඊට

අවැඩක් කළ හොත් ඔබට දැඩි ලෙස දඬුවම් ලැබෙනවා. ඔබ දරුවෙක් බවට පත් වීමෙන් පසුවත්, පාපකාරී ක්‍රියා කළහොත් සිය දහස් ගණනින් ඔබට දඬුවම් එකතු වෙනවා. එමනිසා, ඔබ තුළ ධෛර්යය තිබෙනවා නම්, ශ්‍රීමත් අනුගමනය කරන්න. සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් ඔබ නාරායන බවට පත් විය යුතුයි. සේවකයෙක් වූවාට කම් නැත කියා සිතන්න එපා. නැහැ. මෙය ඉතා විශාල මල්දාමයක්. බොහෝ සීමා තිබෙනවා. මෙහිදී සිත අධෛර්ය කර ගන්න එපා. ඔබ වැටෙන්න ඉඩ තියෙනවා. නමුත්, එවිට හෘදයාබාධ ඇති කර ගන්නේ නැතිව සැලකිලිමත් වන්න. මෙය තමයි ඔබට ශිව බාබාගෙන් එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලැබිය හැකි වූ එකම සාප්පුව. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. උසස් තත්ත්වයක් හිමිකර ගැනීම උදෙසා, ශිව බාබාගේ සාප්පුවෙහි හොඳ වෙළෙන්දෙක් බවට පත් වන්න. සෑම කෙනෙකුගේම නාඩි අල්ලා පසුව දැනුම දෙන්න.
2. කෝපයට ගොදුරු වීමෙන් දුක් දනවන වචන කතා කරන්න එපා. පියාගේ සහකරුවෙක් වීමට පොරොන්දුවක් දුන් පසු අවැඩක් සිදු කරන්නා වූ කිසිවක් කරන්න එපා.

**වරදානය:** "කිසිවක් අලුත් නොවේ" යන අවබෝධයෙන් ඔබ අත්දැකීම් වල ප්‍රතිරුවක් වී සියලු බාධක ක්‍රීඩාවක් ලෙසින් සලකා ඒවා ජයගන්න.

ආරම්භයේ සිට අවසානය දක්වා බාධක පැමිණීම නියමිත වූවක්. එහෙත් එම බාධක කළ නොහැකි දෙයක් වුණත් කළ හැකියි කියන අත්දැකීමක් ඔබට ලබා දෙයි. අත්දැකීම් ඇති ජීවාත්මයන්ට බාධක ක්‍රීඩාවක්ය. උදාහරණයකට, පාපන්දු ක්‍රීඩාවේදී ඔබ වෙතට පන්දුවක් එද්දී ඔබ ඊට පයින් පහරක දී එම ක්‍රීඩාවෙන් විනෝදයක් ලබයි. මේ අයුරි මෙම බාධක පැමිණෙන ක්‍රීඩාවද දිගටම සිදුවේ. එය අලුත් දෙයක් නොවෙයි. අපට මේ ක්‍රීඩාවන් පෙන්වා දෙන නාටකය සම්පූර්ණ සාර්ථකත්වය ද පෙන්වා දෙයි.

**පාඨය:** සෑම දෙනාගේ ම යහගුණ දකිමින් විශේෂතා වල සුගන්ධය මේ ලොවෙහි විහිදුවා හරින්න. එවිට එය සම්පූර්ණ සතුට බවට පත්වනවා ඇත.

***** ඕම් ශාන්ති *****